## 2019 පෙබරවාරි මස 18 වන දින සිට 2019 පෙබරවාරි මස 24 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

## 'සැබෑ දේව පුතෙකු ලෙස ඒ දේව අභිමානය අයිති කර ගනිමු '

01. ආරම්භක ගීය :

පුබුදු ගී අංක 02 "නමෝ නමෝ ශුද්ධාත්මයාණෙනි...."

02. ප්‍රශංසාවට යොමුව :

* දැනට වසර දෙකක කාලය තුළ ශුද්ධාත්මයාණන් වහන්සේ අපගෙන් ඉල්ලා සිටිය 'මනස්ස්ථාපනයට' ඇතුළුවීමේ මහා වරප්‍රසාදය අප ඇතුල් වී සිටිනවා. පසුගිය දින පැවති ශුද්ධාත්ම ස්නාපන මංගල මහෝත්සවයේදීත්, වගකීම් ගන්නා අයගේ කඳවුරේදීත් අපට ගැඹුරින් එයට අවදි වෙමින් ඇතුලතට ගමන් කරන්න ලැබුණි.
* සැබවින්ම මේ මනස්ථාපනය අපගේ ජීවිත පරිවර්ථනයකට යොමු කරනවා නොවේද? මින් පෙර අපි කැමති වුනාද අපගේ ජීවිතවලට අන් අයට අත තැබීමට ඉඩ දෙන්න. අප, අප දෙසම බලා සැබවින්ම වෙනසක් ඇතිකර ගන්න උත්සාහ කරනවා නොවේද? මෙතෙක් අප සිතා සිටියේ පාපළුච්ඡාරණය කිරීම, දිව්‍ය පූජාවට සහභාගි වීම, ගිහිදූත සේවාවන්ට නියැලී ක්‍රියා කිරීම, භක්ති අභ්‍යාස සිදු කිරීම යහපත් කිතුනු ජීවිතය බවයි. බොහෝ කිතුනුවන් සිතා සිටින්නේද එලෙසමයි. එහෙත් මේ මනස්ස්ථාපනය යන මේ සමිඳු ඉල්ලීමට ඇතුළු වීමේදී අප ජීවිත උඩු යටිකුරු කරන අත්දැකීමට ඇතුළුව සිටිමු.
* අප එයින් ලබා ඇත්තේ සැබවින්ම දේව ප්‍රසාද නිධානයන් නොවේද? සැමගෙන් අපව වෙන් කර ගෙන දෙවියන් වහන්සේ අපව රැගෙන යන මේ ජීවිතය කොතරම් වාසනාවන්ත ද? ඒ ගැන අපි දෙවිඳුන්ට කොතරම් ප්‍රශංසා කළ යුතුද?
* පුබුදු ගී අංක 295 "ඔසොවා තුති පුදා...."

03. සුපුවත :

* ශු.මතෙව් 4:17, ශු.මාක් 1:15 අදාළ පාඨ කියවන්න. "මනස්ස්ථාපනය වන්න; සුභ අස්න අදහාගන්න" කුමක්ද මේ සුභ අස්න? (කුඩා කණ්ඩායම් තුළ සාංඝික කර ගන්න)
* සමිඳුන් නිතරම කථා කළේ රාජ්‍යය ගැනයි. එය ජේසුගේ ජීවිතයේ අන්තර්ගතයයි. රාජ්‍යය ඔවුන් වහන්සේගේ ජීවිතයෙන් වෙන් කරන්න බැහැ. කුමක්ද මේ අදහාගන්න ලෙස ඉල්ලන සුභ අස්න? ඒ දේව රාජ්‍යය ගැන සුභාරංචියයි. ඒ අබ්බා පියාණන් ගැනයි. එය අදහා ගන්න. විශ්වාස කරන්න කියලා ඉල්ලා සිටිනවා.
* සමිඳුන් අදහා ගත් පියාණන් වහන්සේගේ රාජ්‍යය ගැන මහත් ප්‍රීතියකින් සිටියා පමණක් නොව එයිනුත් ජ්වලිතභාවයකින් ක්‍රියා කළා. තමන් වහන්සේට මුහුණ දීමට සිදුවන දූත කාර්යයත්, මරණයත් ගැන ඉතා හොඳින් දැන සිටියා. විටින් විට සිය ශ්‍රාවකයින්ට ද ඒ බව ප්‍රකාශ කළත් කිසිවිටෙක කම්පාවට පත්ව මුහුණ එල්ලා ගෙන සිටියේ නැහැ. කිසිදු බයක්, කලබලයක් ඔවුන් වහන්සේ තුළ තිබුනේ නැහැ. සෑම අභියෝගයකටම නොබියව මුහුණ දුන්නා.

* ශ්‍රාවකයින් මෙන්ම පරිසිවරුන්ගෙන් සමහරෙක් ද සිය ගුරු දේවයන්ට මුහුණ දීමට සිදු වී ඇති ජීවිත තර්ජන ගැන දැන සිටියා. "මෙතැනින් අහක්ව ගිය මැනව. මන්ද හෙරෝද් ඔබ මරනු රිසියෙන් සිටින්නේය"යි කීහ. එවිට සමිඳාණන් මහත් එඩිතර බවකින් හඬ නගා ප්‍රකාශ කළේ, "ඔබ ගොස් ඒ හිවලාට මෙසේ කියන්න. අදත් හෙටත් මම යකුන් දුරු කොට රෝග සුව කරමි.තුන් වෙනිදා මාගේ පරමාර්ථය මුදුන් පත් කර ගන්නෙමි."(ශු.ලූක් 13:31-32) යනුවෙන් අභියෝග කළේ අභිමානවත් දේව පුතා ලෙස රටේ පාලකයාට ය.
* සිය ජීවිතය පවා නොසලකා සමිඳාණන් ප්‍රකාශ කරන ශුභාරංචිය ගැන සුවිශේෂකවරු අපට කියන්නේ කුමක් ද? විවාහපත් යුවලකට දරුවෙකු ලැබීමේ ආරංචිය, සිය දරුවා විභාගයකදී ඉහළම සාමාර්ථයක් හිමිකර ගැනීමේ ආරංචිය ඔවුන්ට සුභාරංචියකි. සුවිශේෂකවරු අපගෙන් ඉල්ලන්නේ එවැන්නක් නොවේ. අපට කියන්නේ උත්ථාන වූ ජේසුව අදහා ගන්න. මුළු විශ්වයේම ඒ ගැලවුම් කරුවාණන් බව විශ්වාස කරන්න.
* ජේසුස් වහන්සේ මිනිසාව පරිවර්ථනයට යොමු කළ හැකි බලය රැගත් තැනැන් වහන්සේ ය. දිව්‍ය යාගයේදී අප ලබා ගන්නා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ තුළින් ජීවමාන ඔවුන් වහන්සේව අප තුළට ලබා ගන්නා අපි වාසනාවන්තයි. දිව්‍ය සත්ප්‍රසාදය තුළින් අප ලබන්නේ ක්‍රිස්තුන් ජේසුස් වහන්සේගේ ශ්‍රී ශරීරයයි, ශ්‍රී රුධිරයයි. මේ මහා බලගතු දේව ප්‍රසාද නිධානය ගැන ලොව පුරා සුභාරංචිය පතල කිරීමේ යෙදී සිටින්නන් පවා පිළිගන්නවා, ප්‍රකාශ කරනවා. කිතුනුවන් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගැනීම තුළ ඔවුන් මහා ප්‍රාතිහාර්යයන් අත්දකින බව. ඔවුන් එයින් ඉටු කරන්නේ සිය ගුරුදේවයාණන්ගේ ඉල්ලීම වන **'මෙන්න මාගේ ශරීරය- මෙන්න මාගේ රුධිරය මා සිහි කිරීම පිණිස මෙය සිදු කරන්න.'**

* දිළිඳු වූ අසරණ වූ අයයි දේව රාජ්‍යයේ සැබෑ හිමිකරුවෝ. කිසිවකින්, කිසිවෙකුට එය උදුරා ගත නොහැක. (කුඩා කණ්ඩායම් තුළ සාකච්ඡා කරන්න)

04. සතිය පුරා :
* සෑම දිනකම උදෑසන අවදිවීමත් සමඟම ඔබේ දේව උරුමය සිහිකරන්න. ඒ අභිමානය අයිතිකර ගන්න. දවස තුළ එය අත්දකින්න උත්සාහ කරන්න.
* හැකි සෑම විටෙක දිව්‍ය පූජාවට සහභාගි වී දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලබා ගන්න. ඉඩ ලද විට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ඉදිරියේ පෙනී සිටින්න.

05. අවසන් ප්‍රශංසාව

===========================

## 2019 පෙබරවාරි මස 25 වන දින සිට 2019 මාර්තු මස 02 වන දින දක්වා

## ප්‍රශංසා එකතු සුපුවත

**"ඔබ තමයි මගේ රාජ්‍යය පිහිටවන්න සුදුසු පුතා" ( 'එවුදොකේසා' - ග්‍රීක් භාෂාව)**

01. ප්‍රශංසාවට හැඳින්වීම :

* පුබුදු ගී අංක 03 "ආ එනු මැනේ ශුද්ධාත්මෙනි ...."

* මෙවර අප ගාම්භීරව පැවැත්වූ සමිඳාණන් වහන්සේගේ ස්නාපන මංගල මහෝත්සවයේ මූලික තේමාව වූ "දේවාත්මයාණන් විසින් මඟ පෙන්වනු ලබන්නෝ දෙවියන් වහන්සේගේ පුත්‍රයෝය" (රෝම 8:14) යන අනාවරණය ඉදිරිපිට මොහොතක් පෙනී සිටිමු.
* ශුද්ධාත්මයාණන් වහන්සේව ශුද්ධවූ බයිබලය තුළ විවිධ සංකේත මඟින් ඉදිරිපත් කරනු ලැබ ඇත. ඉන් එක් සංකේතයකි. 'සුළඟ'
* ශුද්ධාත්ම සුළඟ කියල කියන්නේ අපි කවුරුවත් හිතන්නෙ නැති තැනකින් පටන් අරගෙන, කොහෙන් එනවද, කොහාට යනවද කියල හිතා ගන්න බැරි විදියේ මහා අභිරහසමක තිළිණයක් (ශු.ජොහාන් 3:8)
* අපේ ජීවිත කොහේ තිබුණද? කොතැන තිබුණද කියල හිතා ගන්න බැරි පැයක ඒ ශුද්ධාත්ම සුළඟ අපව මේ ගමන රැගෙන ඇවිත් ඔවුන් වහන්සේට ඕන තැන ඔබව මාව තබා තිබෙනවා. එලෙසින් අප නිරන්තරයෙන් අවදිව ඉඩදෙන විට සිටින තැනින් සිටිය යුතු තැනට රැගෙන යන ශුද්ධාත්මයාණන් වහන්සේත්, අපගේ එකම සමිඳාණන් වහන්සේ හා එකම ගැළවුම් කරුවාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ සමගින් අබ්බා අම්මා වූ මහෝත්තම දෙව් පියාණන් වහන්සේට අපගේ ප්‍රශංසාව, ස්තුතිය, හා නමස්කාරය පුද කරමු.

* පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරවූ මහ පොළොව පවා..."

02. පසුගිය සතියේ සුපුවත මුල් කරගෙන අත්දැකීම් බෙදා ගැනීම....

03. දවසේ සුපුවතට හැඳින්වීම :
* අද දින අප සුපුවත ලෙස සමිඳාණන් වහන්සේගේ ස්නාපන මංගල මහෝත්සවයේ දිව්‍ය පූජෝත්සවයේදී බෙදාගත් සුපුවත ඇසුරෙන් සකස් කර ඇත.

* අප ආදර ස්වාමි තාත්තා 1984 සිට සමිඳාණන් වහන්සේගේ ස්නාපන මංගලෝත්සවයේ දී ඉතා මහඟු අනාවරණයක් අපට දානය කර ඇත. එම අනාවරණය පුබුදු කැරිස්මාවේ 2වන අත්දැකීමයි. එනම් ක්‍රිස්තුස් වහන්සේ වෙත අපගේ නෙත සිත හදවත යොමු කිරීමයි. එසේ ඔවුන් වහන්සේ දෙස බලන විට අපට දකින්නට ලැබෙන්නේ ඔවුන් වහන්සේගේ පුත්‍රභාවයේ අත්දැකීමයි.

* බෙදා ගැනීම : මේ පුත්‍රයාණෝ කොහොමද ඒ පුත්‍රභාවය අයිතිකර ගත්තෙ? ඒ තාත්තට කොහොමද කීකරු වුණේ? තාත්තත් එක්ක ඒ සම්බන්ධතාවය තියාගන ගියේ? (ළඟ ඉන්න කෙනෙක් එක්ක බෙදා ගන්න)
* පිලිප්පි 2:5-11 **" ඔවුන් වහන්සේ දේව බලය, දේව තේජස, දේව මහිමය හිස්කර අප හා සමාන මනුෂ්‍යයකු වූ සේක."**

* බලන්න, මේ ලස්සන සිද්ධිය. මඩ තැවරුණු, මඩ පිරුණු ජෝර්දාන් නදී තීරය පාගාගෙන, සිය දහස් ගණනක් ඒ වන විටත් ස්නාවක ජොහාන් තුමා අතින් ඒ ජලයේ ගිල්වනු ලබලා, ප්‍රසාද ස්නාපනය ලබලා, කිළිටි වෙලා තිබුණු, බොරවෙලා තිබ්ච්ච ඒ වතුරටම අප සමිඳාණන් වහන්සේත් බහිනවා, ඒ ජනතාවත් එක්ක එකතුවෙල අන්තිමයා හැටියට ඔවුන් වහන්සේ පෙනී සිටිනවා. මොන තරම් බැහැපත් කමක්ද? එහිදී සිදුවූ දේ පිළිබඳව අප දන්නවා.
* ශු. මාක් 1:11 **"ඔබ ගැන මම ප්‍රසන්නනව සිටිමි"** යන වදනට සමාන ග්‍රීක් භාෂාවෙන් යෙදෙන වචනය **"එවුදොකේසා"** යන්නයි. මෙම වදනේ මතුපිට අර්ථය වන්නේ **"ඔබ ගැන මම සතුටුයි"** යන්නයි. නමුත් මෙම වදනේ සැබෑ අර්ථය **"ඔබ තමයි මගේ රාජ්‍යය පිහිටුවන්න සුදුසුම පුතා"** යන්නයි.
* **"එවුදොකේසා"** යන වචනයේ මහා බරපතල පැත්තක් භයානක පැත්තක් ඇත. එනම්, සුදුසු පුතෙකුට පමණයි රාජ්‍යය වෙනුවෙන් කැප වෙන්නට පුළුවන්, රාජ්‍යය වෙනුවෙන් වැඩ කරන්න පුළුවන්.
* ක්‍රිස්තුස් වහන්සේ මේ පිළිබඳව දැනගෙන සිටියා. අවුරුදු 30ක් තිස්සේ අභිරහස්මක ශුද්ධවූ ප්‍රේමය ඉදිරියේ පුත්‍රයාණෝ විශ්මිතව බලා සිටිසේක. විටෙක සමීපවන, විටෙක අභිරහස්මක ලෙස වැඩ වසන, මගේ අබ්බා වෙනස්, හැමොටම වඩා වෙනස්, අන්‍යයයි. මේ බව මේ **'සුදුසු පුතා'** දැනගෙන සිටි සේක. එහෙත් ජෝර්දාන් නදියේ දීයි තමන් වහන්සේ **"එවුදොකේසා"** බව ස්ථිරවම දැනගනු ලැබුවේ.
* ඒ අත්දැකීමත් සමඟ ඔවුන් වහන්සේ තාත්තාගේ ශුද්ධ වූ, අන්‍ය වූ, වෙනස් වූ, අභිරහස්මක ප්‍රේමය ඉදිරියේ තාත්තාගේ ශුද්ධවූ කැමැත්ත පූර්ණව ඉටු කරමින් කුරුසිය මත අන්තිම ලේ බිංදුව දක්වා සිඳ හෙළමින් ජීවිතය පූජා කරන ඒ මහා ගමන ආරම්භ කළ සේක.

04. අප දෙසට : (කුඩා සංඝ ලෙස බෙදා ගනිමු)

* ස්වාමි තාත්තා ප්‍රකාශ කර තිබෙනවා මේ **"රාජ්‍යය පිහිටුවන්න සුදුසුම පුතා** යන අත්දැකීමට කැඳවන සැම දෙනාට අබ්බා තාත්තා කථා කරන්නේ **කුරුසියේ භාෂාවකින්** බව. එයට හේතුව කුමක් විය හැකිද?

* දිනපතා අභිරහස්මකවූ ප්‍රේමය ඉදිරියේ තනි වෙන්න, යාච්ඤා කරන්න, ඔබට වෙලාවක්, ස්ථානයක්, වුවමනාවක් තිබෙනවාද? නැත්නම් මේ දැන් තීරණයකට පිවිසෙන්න. ඒ බව බෙදා ගන්න.

* ශුද්ධවූ සභා මාතාව තුළට පිබිදීමේ අත්දැකීම රැගෙන යන්නට 'සුදුසු පුතා / දුව' බව ඔබ පිළිගන්නවාද? මේ සඳහා පෞද්ගලිකව, පවුල් හැටියට, ප්‍රශංසා ගමක් හැටියට, සංඝයක් හැටියට ගත හැකි ප්‍රායෝගික පියවර මොනවාද? ඒවා ක්‍රියාත්මක කරන්න අධිෂ්ඨානය කර ගන්න.

05. අවසන් ප්‍රශංසාව :

* **"දේව රාජ්‍යය පිහිටුවන්න සුදුසුම පුතා / දුව** වෙනු සඳහා මගේ ජීවිතයේ හැරිය යුතු තැන් මොනවාද? මේ ගැන මොහොතක් අවදි වෙමු. හැකි නම් ඉන් එකක් තව කෙනෙක් සමඟ බෙදාගන්න.

* පුබුදු ගී අංක 291 "හැරෙන්න සුපුරුදු ගමන නවත්වා...." (පළමු පදය හා අවසාන පදය ගයමු)

******************